| | | |
|---|---|---|
| | **බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | |
| | Depatrtment of Education - western province | |
| **7 ශ්‍රේණිය** | **පළමු වන වාර ඇගයීම - 2018** | |
| | **ගණිතය** - I / II | කාලය : පැය 02 යි. |

නම : ........................................................................................................ විභාග අංකය : ..................................................

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමි වේ.**

01. පහත රූපයේ සමමිති අක්ෂ සියල්ල ඇඳ දක්වන්න.



02. පහත දැක්වෙන ප්‍රකාශන නිවැරදි නම් ඉදිරියෙන් හරි ලකුණ ද (✓) වැරදි නම් ඉදිරියෙන් වැරදි ලකුණ (×) යොදන්න.

(a) ද්විපාර්ශ්වික සමමිතික රූපයක සමමිතික අක්ෂයක දෙපස පිහිටි කොටස් දෙක හැඩයෙන් හා වර්ගඵලයෙන් සමාන වේ. (.........)

(b) යම් තල රූලයක් යම් රේඛාවක් ඔස්සේ නැමීමේදී ලැබෙන කොටස් දෙක හැඩයෙන් හා වර්ගඵලයෙන් සමාන වන නමුත් එම කොටස් දෙක සමපාත නොවේ නම් එම රේඛාව තල රූපයේ සමමිතික අක්ෂයන් වේ. (.........)

(c) සමචතුරස්‍රයක හා සෘජුකෝණාස්‍රයක සමමිති අක්ෂ ගණන සමාන වේ. (.........)

(d) ද්විපාර්ශ්වික සමමිති තල රූපයක සමමිතික අක්ෂ දෙකක් වුවද තිබිය හැකිය. (.........)

03. A = {තුන් දහස් හයසිය හැට හය} නම් A කුලකයේ අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න.

04. A = {a , e, i , o, u} කුලකය වෙන් රූප සටහනක් මගින් නිරූපණය කරන්න.

05. සුළු කරන්න. (i) 8 + 3 × 5 = (ii) 5 × 8 - 8 =

06. අගය සොයන්න. 15 + (14 - 5) ÷ 3 =

07. පහත සංඛ්‍යා අතුරින් බෙදීමෙන් තොරව 9 න් බෙදෙන සංඛ්‍යා තෝරා යටින් ඉරක් අඳින්න.

(i) 2106 (ii) 8342 (iii) 5628 (iv) 9991

---

08. 19 ☐ 2 යන ඉලක්කම් හතරකින් යුත් සංඛ්‍යාව 6 න් ඉතිරි නැතිව බෙදේ නම් හිස්කොටුවට ගැළපෙන සංඛ්‍යාවක් ලියන්න.

---

09. 60 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියා දක්වන්න.

---

10. 2, 3, 5 යන සංඛ්‍යාවල මහා පොදු සාධක සොයන්න.

---

11. $a^3$ හි

(i) පාදය ලියන්න.

(ii) දර්ශකය ලියන්න.

---

12. (i) $5^2\,a^2$ ගුණිතයක් ලෙස විහිදුවා ලියන්න.

(ii) $2 \times 2 \times 2 \times p \times p$ දර්ශක ආකාරයෙන් ලියන්න.

---

13. ක්‍රි.ව. 2001 සිට ක්‍රි.ව. 2100 තෙක් කාල පරිච්ඡේදය අයත් වන්නේ කුමන සිය වසට ද?

---

14. පහත වර්ෂ අතුරින් අධික අවුරුදු තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ක්‍රි.ව. 1900 (ii) ක්‍රි.ව. 2000 (iii) ක්‍රි.ව. 2004 (iv) ක්‍රි.ව. 2010

---

15. ABCD සෘජුකෝණාස්‍රයකි. මෙහි සමාන්තර රේඛා ඇත්නම් ඒවා සමාන්තර බව අංකනයෙන් නිරූපනය කර දක්වන්න.



16. AB රේඛාවට A හිදි ලම්භ රේඛාවක් ඇද
එය AP ලෙස නම් කරන්න.




---

17. (i) (- 4) + (+ 6) හි අගය ලබා ගන්නා අයුරු සංඛ්‍යා රේඛාවේ නිරූපණය කරන්න.

(ii) පිළිතුර ලියන්න.




---

18. අගය සොයන්න. $\left(-\frac{2}{5}\right) + \left(-\frac{2}{5}\right)$

---

19. ඔරලෝසුවේ පැය කටුවත් මිනිත්තු කටුවත් අතර සුළු කෝණයක් සෑදෙන පරිදි පිහිටීමක වේලාව ලියා දක්වන්න.

---

20. රූපයේ දත්ත අනුව මහා කෝණයත් නම් කරන්න.




---

## II කොටස

- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින් හිමි වේ.**

01. (a) ඔබ පංතියේ ඉගෙන ගත් සාධක හා ගුණාකාර යන පාඩම සිහිපත් කරන්න.
   (i) 6521 සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය කීයද? (ල. 02)
   (ii) 72 හි ගුණාකාර දෙකක් 2 × 36 හා 3 × 24 වේ. මෙහි තවත් ගුණාකාර තුනක් ලියන්න. (ල. 03)
   (iii) 24, 30, 18 සංඛ්‍යා ප්‍රථම සාධක වල ගුණිතයක් ලෙස ලියන්න. (ල. 03)
   (iv) එම සංඛයා තුනෙහි කුඩා පොදු ගුණාකාරය සොයන්න. (ල. 03)

   (b) ළමයෙකුට පැය 3 කට වරක් පැය 6 කට වරක් හා පැය 8 කට වරක් බෙහෙත් පෙති වර්ග තුනක් බීමට වෛද්‍යවරයෙක් නියම කලේය. ඔහු මෙම බෙහෙත් පෙති තුනම පෙ.ව. 8 ට එකවර ම පානය කලේ නම් නැවතත් පෙති තුනම එකවර පානය කිරීමට සිදු වන්නේ පැය කීයකට පසුවද? (ල. 05)

02. (a) (i) ළමයෙක් අවු. 2 මාස 9 දින 21 ක් වෑන් රථයකින් ද අවු. 5 මාස 11 දින 18 ක් බස් රථයෙන් ද පාසල් ගියේය. ඔහු වෑන් රථයෙන් හා බස් රථයෙන් ගමන් කර ඇති මුලු කාලය කොපමණද? (ල. 04)
   (ii) 2018.02.15 වන දිනට ළමයෙකුගෙ වයස අවුරුදු 12 මාස 3 දින 2 ක් වේ. ඔහුගේ උපන් දිනය කවදාද? (ල. 04)

   (b) ඒකාකාර වේගයෙන් උස යන ගසක් දිනකට 3cm ක් උස යයි. අධික අවුරුද්දක දී එම ගස කොපමණ උස යයි ද? පිළිතුර මීටර්වලින් ලියන්න. (ල. 03)

03. සුළු කරන්න.

(i) $(36 \times 3) \div 9$ (ල. 03)

(ii) $36 \div (4 \times 3) - 3$ (ල. 04)

(iii) වෛද්‍යවරයක් සායනවලදී (බොහෙත් දීමේදී) සෑම මිනිත්තු 15 කට ම රු. 1200 ක් අය කරයි. ඔහු දිනකට පැය 2 බැගින් දින හතක් සායනවලට සහභාගි වේ නම් ඔහු සතියක දී උපයන මුදල කොපමණද? (ල. 04)

04. සුළු කරන්න.

(i) $(-3) + (+1)$ (ල. 02)

(ii) $(-5) + (-4)$ (ල. 02)

(iii) $(-5) + (+5)$ (ල. 01)

(iv) $(+4.25) + (-3.75)$ (ල. 03)

(v) $(-2.15) + (-1.63)$ ( ල. 03)

05. විහිත චතුරස්‍ර හා සරල දාරයක් භාවිතයෙන් පහත නිර්මාණය එකම රූපයක නිර්මාණය කරන්න.

(i) රේඛා ඛණ්ඩයක් ඇඳ AB = 7 cm වන සේ A හා B ලක්ෂ්‍ය ලකුණු කරන්න. (ල. 02)

(ii) A හිදී AB ට ලම්බකයක් අඳ A හි සිට 5 cm දුරින් C ලක්ෂ්‍ය ලකුණු කරන්න. (ල. 04)

(iii) AB ට සමාන්තර C හරහා රේඛාවත් අඳින්න. (ල. 03)

(iv) ACBD ඍජුකෝණාස්‍රය සම්පූර්ණ කරන්න. (ල. 02)

06. පහත එක් එක් කෝණය කෝණමාණය භාවිතයෙන් ඇඳ එම කෝණ වර්ගය ලියන්න.

(i) $40^0$ (ල. 03)

(ii) $110^0$ (ල. 03)

(iii) $260^0$ (ල. 03)

(iv) ඉහත ඔබ ඇඳි $40^0$ කෝණය $A\hat{B}C$ ලෙස නම් කර ශීර්ෂය හා බාහුවක් නම් කර ලියන්න. (ල. 02)

07. (a) ද්විපාර්ශ්වික සමමිතික රූපයක් ලැබෙන සේ මෙම රූපය සම්පූර්ණ කරන්න. (ල. 05)

(b) x = 2 , y = 3 නම් පහත ප්‍රකාශනයේ අගය සොයන්න.
$2x^2y$ (ල. 04)

(c) වෙන් රූපයේ දක්වා ඇති කුලකය සඟළ වරහනක් තුළ වචනයෙන් ලියා දක්වන්න. (ල. 02)




